"ව්‍යාපාරික ලෝකයට ආ සරාගී ටෙනිස් ක්‍රීඩිකාව" යන සිරස්තලය සමගින් ඊරිදා ලංකාදීප පුවත්පතේ (10/10) ටෙනිස් ශූරියක් වන මරියා ෂරපෝවා පිළිබඳ ලිපියක් පළ වී තිබිණි. එහි පුවත් අන්තර්ගතයේද ඇය පිළිබඳව "අතිශය සුරූපී සරාගී" යන විශේෂණයන් යෙදී තිබිණි.

ක්‍රීඩාවන්ට සම්බන්ධ කාන්තාවන් පිළිබඳ ලිපි පළ කිරීමේදී බොහෝ විට ඔවුන්ගේ ක්‍රීඩා කුසලතාවයන්ට ප්‍රමුඛත්වය ලබා දීම වෙනුවට, ඔවුන්ගේ බාහිර ස්වරූපය ඉදිරිපත් කිරීම ඔස්සේ ඔවුන්ව ලිංගික වස්තූන් ලෙසින් හැඟවුම්කරණය කිරීම ඇතැම් විට මාධ්‍ය තුළ දැකිය හැක.

1) ඔබට අනුව, මෙම පුවතට අදාළ විය යුත්තේ ඇගේ "සුරූපී, සරාගී" බවද? නැතිනම් ඇගේ ක්‍රීඩා කෞශල්‍යය සහ ක්‍රීඩා ශූරත්වයෙන් ලද ජනප්‍රියත්වද?

2) මෙවැනි හැඳින්වීම් ඔස්සේ ඇයගේ බාහිර ස්වරූපය ඔස්සේ ලිංගික වස්තුවක් ලෙසින් හැඟවුම්කරණය කිරීමක් සිදු නොවන්නේ ද?

3) එසේ නම්, එය ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වෙමින් සිදුකරන කොන් කිරීමක් යැයි ඔබ සිතන්නේ නැතිද?

**#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa**